ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date 2024.09.28

කේ.එම්.පී.ජේ. පෙරේරා මිය
63-119/ඒ, දඹහේන පාර,
මහරගම.

පැමිණිලි පාර්ශවය

ලුතිනන් ආර්.ඒ. චන්ද්‍රරත්න (නි/69667)
10 වන ගජබා රෙජිමේන්තුව,
සාලියපුර.

වින්දිත පාර්ශවය

1. ලුතිනන් ආර්.ඒ.ආර්.ටී.දම්රුවන් (නි/69359)
   ගජබා රෙජිමේන්තුව
   ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

2. කපිතන් බී.ඒ.බෝම්බුවල (නි/67954)
   ගජබා රෙජිමේන්තුව
   ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

3. ලුතිනන් පී.ඩී.එස්.ඩයස් (නි/69286)
   ගජබා රෙජිමේන්තුව
   ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

වගඋත්තර පාර්ශවය

<u>පැමිණිලි අංකය- **HRC/1365/18**</u>

<u>පැමිණිල්ල</u>

පැමිණිලිකාරිය විසින් 2018.04.23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ සිය පුත්‍රයා වන ආර්.ඒ.චන්ද්‍රරත්න, 2011 ජූලි මස 06 වන දින පාඨමාලා අංක 77 යටතේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස යුධ හමුදා සේවයට එක්වූ බවත්, 2014 ජූනි මස 29 වන දින අධිකාරියට පත්වීමෙන් පසු 10 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවට අනුයුක්තව අකුරගොඩ යුධ හමුදා ඉදිකිරීම් පරිශ්‍රයේ රාජකාරි ඉටුකරමින් සිටි බව සඳහන් කර ඇති අතර, එම රාජකාරිවලට අමතරව රෙජිමේන්තු රගර් සහ ක්‍රිකට් කණ්ඩායම්වල වගකීම් ද ඔහු වෙත පැවරී තිබූ බවත්ය. එම කාලසීමාව තුළ ඉහළ නිලධාරීන් ඔහුට වරින් වර පහරදීම් කළ බව ද පැමිණිල්ලේ සඳහන් වේ. 10 වන ගජබා රෙජිමේන්තුවේ කපිතාන්

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. No. 14, R. A. De Mel Mawatha, Colombo 04.	සභාපති தவிசாளர் Chairman 011 - 250 5451	ෆැක්ස් தொலைநகல் Fax 011 - 250 5541/74	ඊමේල් மின்னஞ்சல் E-mail	sechrcsl@gmail.com
දුරකථනය தொலைபேசி Telephone	94-11-2505580 / 81 / 82	ලේකම් செயலாளர் Secretary 011 - 250 5521	ක්ෂණික துரித அழைப்பு Hotline 1996	වෙබ් இணையம் Web	www.hrcsl.lk

බී.ඒ.බෝම්බුවල, ලුතිනන් ඩයස් සහ ලුතිනන් දම්රුවන් යන නිලධාරීන් විසින් පැමිණිලිකාරියගේ පුතු ආර්.ඒ.චන්ද්‍රරත්නගේ හිස ප්‍රදේශයට පහර දී ඔහුව කඳවුරේ කාමරයක් තුළ දින තුනක් සිරකර තබාගෙන වරින් වර වධහිංසා පමුණුවා ඇති බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙලෙස සිරකර තබාගැනීමේදී එම නිලධාරීන් විසින් පුත්‍රයාට අධි මාත්‍රාවෙන් යුත් වේදනානාශක පෙති ලබා දී ඇති බව පසුව කරන ලද පරීක්ෂණවලදී තහවුරු වූ බවත්, එම අවස්ථාව වන විට ඔහු දැඩි සිහිමද ගතියකින් පසුව ඇති අතර, එල්ල වූ වධහිංසා දරාගත නොහැකිව ඔහු කඳවුරෙන් පිටවී පැමිණීමෙන් අනතුරුව, පහරදීම නිසා ඇති වූ තදබල හිස වේදනාව හේතුවෙන් සිහිසුන්ව ඇද වැටී සිටියදී 2015 සැප්තැම්බර් 26 වන දින නාරාහේන්පිට යුධ හමුදා රෝහලට ඇතුළත් කළ බවයි. ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය බරපතල වූ බැවින් 2015 සැප්තැම්බර් 27 වන දින කොළඹ ජාතික රෝහලේ 63 වන වාට්ටුවේ ස්නායු වෛද්‍ය ඒකකයට ඇතුළත් කෙරුණු අතර, පසුව ඇති වූ මානසික ව්‍යාකූලතාවය හේතුවෙන් 59 වන වාට්ටුවේ මානසික වෛද්‍ය ඒකකය වෙත යොමු කළ බවත්ය. ඉන් අනතුරුව දින 16 කට පසු යළි යුධ හමුදා රෝහලේ 19 වන වාට්ටුවේ මානසික වෛද්‍ය ඒකකයේ කර්නල් මොනරාගල යටතේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටින බව ද වැඩිදුරටත් පැමිණිල්ල මඟින් සඳහන් කර ඇත.

තම පුතු ජාතික රෝහලට ඇතුළත් කළ අවස්ථාවේදී එවකට ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර්වරයා ද එම ස්ථානයට පැමිණ සිටි බවත්, පසුව යුධ හමුදා පොලිසිය විසින් පරීක්ෂණ ආරම්භ කර එවකට අණදෙන නිලධාරීව සිටි මේජර් ඩයස් යන අයව එම ධුරයෙන් ඉවත් කර සාලියපුර කඳවුර වෙත මාරු කර යැවූ බවත්ය. පහරදීමට සම්බන්ධ අනෙක් නිලධාරීන් යුධ හමුදා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන පොල්හේන්ගොඩ කඳවුරේ සිර මැදිරියක රඳවා තැබූ බවද දැනගන්නට ලැබුණු බවත්, මෙම පහරදීම හේතුවෙන් පුතුගේ මානසික මට්ටම අයහපත් අතට හැරී තිබූ අතර ඔහු වරින් වර සියදිවි නසා ගැනීමට පවා උත්සාහ කළ බවත්ය. මේ සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් එවකට යුධ හමුදාපතිව සිටි ලුතිනන් ජෙනරාල් ක්‍රිෂාන්ත ද සිල්වා මහතා හමුවී කරුණු පැහැදිලි කළ විට, පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් වින්දිත නාරාහේන්පිට යුධ හමුදා රෝහලේ පමණක් රඳවා තබන බවට එකඟ වූ බවත් සඳහන් කර ඇත.

මෙම සිදුවීමෙන් පසුව වසර දෙකහමාරක පමණ කාලයක් ගතවී ඇතත්, සිදුකරන ලද පරීක්ෂණවලදී පුත්‍රයාට සිදු වූ පහරදීම වසන් කරමින් ඔහු කඳවුරෙන් පැන ගිය බවට ව්‍යාජ තොරතුරු මත පරීක්ෂණ ප්‍රතිඵල ලබාදීමට බලධාරීන් උත්සාහ කරමින් සිටින බව දැනගත් බවත්, පහරදීම සිදු කළ නිලධාරීන් එය පිළිගෙන තිබියදීත් ඔවුන්ට අවවාද කිරීම පමණක් සිදු කර, පුත්‍රයාට වරද පවරා ඇති බවත් සඳහන් කර ඇත. එසේම යුද්ධ හමුදා පරීක්ෂණ අතරතුර වරින් වර ඔහුව බලහත්කාරයෙන් රැගෙන යාමට ගජබා රෙජිමේන්තුව උත්සාහ කිරීම නිසා ඔහු දැඩි මානසික පීඩනයකට ලක්වූ බවත්, මේ වන විට ඔහු හමුදා සේවයට නුසුදුසු මට්ටමේ පහළ වෛද්‍ය වර්ගීකරණයකට ලක් කර වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කළ බවත්ය. තවද, හිටපු අණදෙන නිලධාරී මේජර් ඩයස් විසින් යුධ හමුදා රෝහලට පැමිණ, තමන් මෙම සිද්ධිය පිළිබඳව කිසිවක් නොදන්නා බවට පුත්‍රයා ලවා බලහත්කාරයෙන් ලිපියක් අත්සන් කරවා ගෙන තිබූ අතර, පසුව එම නිලධාරියා උසස්වීම් ද ලබා ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

හිසට එල්ල වූ පහරදීම් සහ නීති විරෝධී ලෙස සිරකර තැබීම පිළිබඳ සාක්ෂි තිබියදීත්, එය පසෙකලා පුත්‍රයාට දඬුවම් දීමට උත්සාහ කිරීම බරපතල අසාධාරණයක් බවත්. යුධ හමුදාපතිවරයා, රණවිරු සේවා අධිකාරිය සහ යුධ හමුදා පොලිසිය ඇතුළු වගකිවයුතු සියලු අංශ දැනුවත් කර තිබියදීත්, සිය පුත්‍රයාට සාධාරණයක් ඉටු නොවීම පිළිබඳව පැමිණිලිකාරිය දැඩි කනස්සල්ලට පත්ව ඇති බවත් සඳහන් කර ඇත. පාසල් අවධියේදී කීර්තිමත් චරිතයකට හිමිකම් කී පුත්‍රයාට සිදු වූ මෙම අගතිය වසන් කරමින් ගජබා රෙජිමේන්තුව ගෙන යන වැඩපිළිවෙළ හමුවේ, මානව හිමිකම් කොමිෂන් සභාවේ

මැදිහත්වීමෙන් පුතුට සාධාරණය ඉටු කර දෙන ලෙසත්, ඔහුව ගෞරවනීය ලෙස යුධ හමුදා සේවයෙන් ඉවත් කර ගැනීම හා වන්දි මුදලක් ලබාගැනීම සහනය වශයෙන් මෙම පැමිණිල්ලෙන් අපේක්ෂා කර ඇත.

<u>වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම -</u>

01. **විමර්ශන කරුණු දැක්වීම**

මානව හිමිකම් කොමිෂන් සභාවේ දී 2019.06.21 වන දින පැවති විමර්ශනයේ දී, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීති නිලධාරී මේජර් බී.බී.එන්.ප්‍රියදර්ශනී මහත්මිය විසින් කරුණු දක්වමින්, මෙම සිදුවීම සම්බන්ධයෙන් යුධ හමුදාව විසින් අභ්‍යන්තර මූලික පරීක්ෂණ උසාවියක් පවත්වා ඇති බවත්, එහිදී ලුතිනන් ආර්.ඒ.ආර්.ඊ.දම්රුවන් යන නිලධාරියා විසින් ලුතිනන් චන්ද්‍රරත්නට පහර දී ඇති බව අනාවරණය වූ බවත්, ඒ අනුව අදාළ නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමටත්, සිද්ධිය වූ ස්ථානයේ සිටි අනෙකුත් නිලධාරීන්ට එරෙහිව ද ක්‍රියාමාර්ග ගැනීමටත් විධානය කර ඇති බවත් සඳහන් කර ඇත. තවද, ලුතිනන් චන්ද්‍රරත්න නිලධාරියාගේ රෝගී තත්ත්වය තරමක් බරපතල බැවින් සහ එය ඔහුගේ අනාගත කාර්යක්ෂමතාවයට බලපාන බැවින්, වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කර ඇති බවත්, ඒ අනුව අදාළ නිලධාරියාට හිමි වන්දි ලබා දී යුධ හමුදාවෙන් ඉවත් කිරීම සඳහා නිර්දේශ කර ඇති බවත්, වැඩිදුරටත් සඳහන් කර ඇත.

නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ වෛද්‍ය ඒ. ඩී. සී. සම්පත් මහතාගේ සහ මනෝ උපදේශක ලුතිනන් පී. ඒ. සී. පී. කේ. පේදුරුආරච්චි මහතා විසින් ද 2019.06.21 දින පැවති විමර්ශනයේ කරුණු දක්වා ඇත. ඒ අනුව වෛද්‍ය වාර්තාවලට අනුව මෙම නිලධාරියා 2015.09.26 දින රෝහල්ගත වී ඇති බවත්, ජාතික රෝහලෙන් ප්‍රතිකාර ලැබීමෙන් පසු යුධ හමුදා රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය කර්නල් ආර්.එම්.එම්.මොණරාගල මහතා විසින් මොහු Adjustment Disorder යන රෝගී තත්ත්වයට පත්ව ඇති බව තහවුරු කර ඇති බව වෛද්‍ය සම්පත් මහතා ප්‍රකාශ කර ඇත. මෙය දැඩි මානසික හෝ කායික පීඩනයක් නිසා ඇති වන්නක් බවත්, මෙම තත්ත්වය මත ඔහු තවදුරටත් යුධ හමුදා රාජකාරි සඳහා සුදුසු නොවන බවත් ඔහු පෙන්වා දී ඇත. මනෝ උපදේශක පේදුරුආරච්චි මහතා වින්දිත නිලධාරියාට තවදුරටත් අඛණ්ඩව මනෝ උපදේශන ප්‍රතිකාර ලබා දීම අත්‍යවශ්‍ය බව සඳහන් කර ඇත.

02. **පළවන වගඋත්තර ලුතිනන් ආර්.ඒ.ආර්.ඊ.දම්රුවන් (නි/69359)**

මානව හිමිකම් කොමිෂන් සභාවේ 2019.06.21 වන දින පැවති විමර්ශනයේ දී කරුණු දක්වමින්, 2015.09.22 වන දින වින්දිත ලුතිනන් චන්ද්‍රරත්න සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර ඇති වූ බහින් බස්වීමක් අතරතුර තමා එම ස්ථානයට ගිය බවත්, එහිදී ඇති වූ ගැටුමක් මත තමා ඔහුට පහරදීමට පෙළඹුණ බවත් එම අවස්ථාවේ තවත් නිලධාරීන් දෙදෙනකු ද එහි සිටි බව සඳහන් කර ඇත. එම බහින් බස්වීමේ ගැටුමේ දී තමාගේ අතින් වින්දිතගේ කම්මුලට පහරවල් 03ක් පහරදුන් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, 2015.09.23 දින ඔහු නැවත මුතූර් ප්‍රදේශයේ රාජකාරියක් සඳහා පිටත්ව ගිය බවත්, දින තුනකට පසු නැවත පැමිණෙන විට ලුතිනන් චන්ද්‍රරත්න කඳවුරෙන් පැන ගොස් ඇති බව දැනගන්නට ලැබුණු බවත්ය. ඔහු විසින් සිදු කළ පහරදීම සම්බන්ධයෙන් යුද්ධ හමුදා පොලිසිය පැවැත්වූ විමර්ශනයට අනුව 2017.07.07දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම්, පුහුණුවීම් සහ වරප්‍රසාද තහනම් කරමින් මාස 6ක දඬුවමකට තමා

ලක් වූ බවත්, ඉන් අනතුරුව නැවත සාමාන්‍ය රාජකාරි සඳහා වාර්තා කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

03. යුද්ධ හමුදාවේ ලිඛිත කරුණු දැක්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2020.09.28 දින ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීමට අනුව,මෙම වින්දිත 2011.07.06 දින යුධ හමුදාවට බැඳී 2014.06.21 දින අධිකාරියට පත්වීමෙන් පසු 2015.07.09 දින සිට පැලවත්ත ත්‍රිවිධ හමුදා ඉදිකිරීම් පරිශ්‍රයේ රාජකාරියේ නිරතව සිට ඇත. එහිදී සිදුවූ බව කියන පහරදීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ උසාවියක් පත්කළ බවත්, එමගින් ලැබුණු යුද්ධ හමුදාධිපති නිගමනයට අනුව 02 වන වගඋත්තරකරු (ලුතිනන් දම්රුවන්) විසින් පැමිණිලිකරුගේ කම්මුලට පහර දුන් බව තහවුරු වී ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව අදාළ පහරදීම සිදු කළ නිලධාරියාට සහ එම ස්ථානයේ සිටි අනෙකුත් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට විධානය කර ඇති බව දැනුම් දී ඇත.

එසේම එම වාර්තාව මගින් වැඩිදුරටත් කරුණු දක්වමින්, වින්දිත ලුතිනන් ආර්.ඒ.චන්ද්‍රරත්න යන නිලධාරියා තමාට සිදු වූ පහරදීම සම්බන්ධයෙන් කිසිදු නිලධාරියෙකු දැනුවත් නොකර සිය අභිමතය පරිදි කඳවුරෙන් බැහැරව යාම සහ රෝහල්ගත වන තෙක් අනුමත නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව ද විනයානුකූලව කටයුතු කිරීමට විධානය කර ඇති බවත්ය. එසේ වුවද, ඔහුගේ අසනීප තත්ත්වය හමුදා සේවයට අදාළ තරමක් බරපතල හා අනාගත කාර්යක්ෂමතාවයට බලපාන බැවින්, වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට විධානය කර ඇති බවයි. ඒ අනුව ඔහුට අදාළ වන්දි මුදල් ලබාදීම සඳහා අවශ්‍ය ලේඛන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ ද, එම අනතුර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් ආවරණය නොවන බව සඳහන් කර ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැති බව දැනුම් දී ඇත.

වැඩිදුරටත් කරුණු දක්වමින්, පවතින නෛතික ප්‍රතිපාදනවලට යටත්ව මෙම සිදුවීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග යුධ හමුදාව විසින් මේ වන විටත් ගෙන ඇති බවත්, එම කරුණු සලකා බලා යුධ හමුදාව මෙම පැමිණිල්ලෙන් මුදා හරින ලෙසත්, පැමිණිල්ලේ කටයුතු අවසන් කිරීමට හැකියාවක් පවතී නම් එය අවසන් කරන ලෙසත් ඉල්ලීම් කර ඇත.

<u>2017.05.13 දිනැති යුද්ධ හමුදාධිපති නිගමනය</u>

වින්දිත ලුතිනන් ආර්.ජී. චන්ද්‍රරත්න 2015 සැප්තැම්බර් 21 වන දින නිවාඩු අවසන් කර සිය ඒකකය වෙත පැමිණි අවස්ථාවේදී, කපිතන් බී.ඒ.බෝම්බුවල සහ ලුතිනන් පී.ඩී.එස්.ඩයස් යන නිලධාරීන් විසින් ඔහුගෙන් රසකැවිලි වර්ගයක් ඉල්ලා ඇති බවත්, පසුව ලුතිනන් ඩයස් විසින් පසුදා උදෑසන තේ පැන් සංග්‍රහය සඳහා කේක් රැගෙන එන ලෙස ඔහුට නියෝග කර ඇත. ඒ අනුව ලුතිනන් චන්ද්‍රරත්න සිය පියා ලවා කේක් රැගෙන විත් භෝජනාගාර සේවකයෙකුට ලබා දී නිලධාරීන් හට ලබාදෙන ලෙස සඳහන් කර තිබුණද සේවක මහතා නිලධාරීන් වෙත කේක් ලබා දී නොමැත. පසුව කපිතන් බෝම්බුවල, ලුතිනන් ඩයස් සහ ලුතිනන් දම්රුවන් යන නිලධාරීන් විසින් ඔහුව ලුතිනන් චන්න යන අයගේ කාමරයට කැඳවා ඇත. එහිදී ලුතිනන් ඩයස්ගේ බලපෑම මත වින්දිත ලුතිනන් චන්ද්‍රරත්නට සිය අභිමතයට පටහැනිව බලහත්කාරයෙන් කේක් අනුභව කිරීමට සිදුවී ඇති බව පරීක්ෂණයේදී තහවුරු වී ඇත.

ඉහත පරිදි වින්දිත ලුතිනන් චන්ද්‍රරත්න බලහත්කාරයෙන් කේක් අනුභව කරමින් සිටි අවස්ථාවේදී, ලුතිනන් ආර්.ඒ.ආර්.ඩී. දම්රුවන් විසින් ඔහුට පහර දී ඇති බව සාක්ෂි මගින් සනාථ වී ඇත. හමුදා පිළිවෙතට අනුව කණිෂ්ඨ නිලධාරියෙකු නිවැරදි කිරීමට අවස්ථාව තිබියදී, එය නොසලකා පහර දීම සම්බන්ධයෙන් ලුතිනන් දම්රුවන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු බව යුධ හමුදාධිපතිවරයා විධානය කර ඇත.

එමෙන්ම, නිවාඩු ගොස් පැමිණි නිලධාරියෙකුගෙන් කේක් ඉල්ලීම හා බලහත්කාරයෙන් කේක් කැවීම වැනි යුධ හමුදා පිළිවෙතට පටහැනි පරිසරයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ලුතිනන් පී.ඩී.එස්. ඩයස් සහ කපිතන් බී.ඒ. බෝම්බුවල යන නිලධාරීන්ට එරෙහිව ද විනයානුකූලව කටයුතු කිරීමට විධානය කර ඇත. තවද, කණිෂ්ඨ නිලධාරියෙකුට මෙවැනි හිරිහැර සිදුවන බව දැන සිටියදීත් ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් නොකළ කපිතන් ඩී.බී.පී.ඩී.එස්. අබේගුණවර්ධන හට අවවාද කිරීමට ද නියෝග කර ඇත.

මෙම හිරිහැර දරාගත නොහැකිව ලුතිනන් චන්ද්‍රරත්න විසින් කිසිදු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට දැනුම් නොදී කඳවුරෙන් බැහැරව යාම සහ රෝහල්ගත වන තෙක් සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව ද විනය ක්‍රියාමාර්ග ගැනීමට යුධ හමුදාධිපතිවරයා විධානය කර ඇත.
මෙම සිදුවීම හරහා වින්දිත ලුතිනන් චන්ද්‍රරත්න ඇතිවූ අසනීප තත්ත්වය හමුදා සේවයට අදාළ වන බවත්, තරමක් බරපතලය එය අනාගත කාර්යක්ෂමතාවයට බලපාන බවත් (යුආගි 01 පත අනුව) නිගමනය කර ඇත. ඒ අනුව, ඔහුව වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර, එහි නිර්දේශ මත සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට යුද්ධ හමුදාධිපතිවරයා විධානය කර ඇත.

<u>වෛද්‍ය වාර්තා</u>

01. කොළඹ ජාතික රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය වාර්තාව

කොළඹ ජාතික රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය මහේෂ් රාජසූරිය මහතා විසින් 2018.11.28 දිනැතිව ඉදිරිපත් කරන ලද වෛද්‍ය වාර්තාවට අනුව, ලුතිනන් ආර්. ඒ. චන්ද්‍රරත්න යන අය ස්නායු රෝග අංශයේ ප්‍රතිකාර ලැබීමෙන් අනතුරුව, ඔහුගේ මානසික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා 2015 ඔක්තෝබර් මස 03 වන දින එම රෝහලේ මනෝ වෛද්‍ය ඒකකය (59 වාට්ටුව) වෙත ඇතුළත් කර ඇත.

රෝගියා විසින් ලබා දෙන ලද තොරතුරු සහ සායනික නිරීක්ෂණ පදනම් කරගනිමින්, ඔහුට සිදු වූ බව කියන පහරදීමෙන් අනතුරුව ඇතිවූ විෂාදය හා පාලනය කරගත නොහැකි භීතිය යන රෝග ලක්ෂණ නිරීක්ෂණය කරන ලද අතර Adjustment Disorder යන රෝග තත්වය හඳුනා ගන්නා ගෙන ඇත. (Adjustment Disorder යනු ජීවිතයේ ඇතිවන වෙනසකට හුරු වීමට ඇති අපහසුව නිසා සිතේ හැඟීම් වල ඇති වන්නා වූ කැලඹිලි සහගත සොබාවයකි. මෙහිදී පුද්ගලයාට සාමාන්‍ය ජීවිතයේ කරනු ලබන ක්‍රියාකාරකම් කරගත නොහැකි තත්වයක් හා සිතේ බිය හා කණගාටුදායක සොබාවයක් ඇති වේ.) මූලික ප්‍රතිකාර ලබා දීමෙන් අනතුරුව, දීර්ඝකාලීන වෛද්‍ය ප්‍රතිකාර සඳහා 2015 ඔක්තෝබර් 06 වන දින ඔහු යුධ හමුදා රෝහල වෙත මාරු කර යවා ඇති බවත් එහි වැඩිදුරටත් සඳහන් කර ඇත.

02. නාරාහේන්පිට යුධ හමුදා රෝහලේ වෛද්‍ය වාර්තාව

2018.12.28 දින නාරාහේන්පිට යුධ හමුදා රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කර්නල් එස්.එම්.ඩබ්ලිව්. හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, ලුතිනන් ආර්. ඒ. චන්ද්‍රරත්න නිලධාරියා යම් ගැටලුකාරී තත්ත්වයක් හේතුවෙන් ඇති වූ මානසික හා චර්යාත්මක වෙනස්කම් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට 2015 ඔක්තෝබර් 06 වන දින එම රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකය වෙත වාර්තා කර ඇති බවත්, රෝග ඉතිහාසය සහ මානසික තත්ත්ව පරීක්ෂණ අනුව, ඔහු Adjustment Disorder නමැති අක්‍රමිකතාවයෙන් පෙළෙන බවට සායනිකව නිගමනය කර ඇති අතර, ඊට අදාළ ඖෂධීය ප්‍රතිකාර සහ උපදේශන සේවා ඔහු වෙත ලබා දී ඇති බව සඳහන් කර ඇත.

යම් ආතතියකට මුහුණ දීමට නොහැකිවීම හෝ ඊට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන් මෙම මානසික තත්වය ඇති වූ බව තත් නිළධාරී හට ප්‍රතිකාර කරනු ලබන මානසික රෝග වෛද්‍යවරයා විසින් පෙන්වා දී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ -</u>

01. වින්දිතගේ මව විසින් කොමිෂන් සභාව වෙත 2018.04.23 දින යොමු කරන ලද පැමිණිල්ල මඟින් වින්දිත චන්ද්‍රරත්න හමුදා නිලධාරියා හමුදා කඳවුර පරිශ්‍රය තුළදී ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසකගේ පහරදීම් සහ හිංසනයන්ට ලක්වීම හේතුවෙන් කායික හා මානසික ආබාධිත තත්ත්වයකට පත්ව ඇති බවට සඳහන් කර ඇත. යුද්ධ හමුදාධිපති නිගමනයේ වින්දිතගේ අසනීප තත්වය හමුදා සේවයට අදාළ වූවක් බවත් අනාගත කාර්යක්ෂමතාවයට බලපාන බව සඳහන් කර තිබියදීත්, ඔහුව වෛද්‍ය මණ්ඩලයක් හරහා ඉවත් කිරීමට යන හෙයින් මේ සඳහා වන්දි මුදලක් ලබාදෙන ලෙස සහනය ලෙස අපේක්ෂා කර ඇත.

02. පැමිණිල්ලට අදාළව 2019.06.21 දින කොමිෂන් සභාවේ දී පැවති විමර්ශනයේදී යුද්ධ හමුදාව වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරිනිය කරුණු දක්වමින්, මෙම පහරදීමේ සිදුවීමට අදාළව අභ්‍යන්තර මූලික පරීක්ෂණ උසාවියක් පවත්වා වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගෙන ඇති බවත්, වින්දිත නිලධාරියා මුහුණ දී ඇති දැඩි මානසික පීඩනය නිසා ඇති වූ Adjustment Disorder හේතුවෙන් ඔහු තවදුරටත් හමුදා සේවයට සුදුසු නොවන බවට වෛද්‍ය මණ්ඩලය මගින් තහවුරු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) ප්‍රකාරව වින්දිත නිලධාරියාට හිමි වන්දි මුදල් ලබා දී ඔහුව යුද්ධ හමුදා සේවයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති බව සඳහන් කර ඇත.

03. 2019.06.21 වන දින කොමිෂන් සභාව හමුවේ පළමු වගඋත්තර ලුතිනන් ආර්.ඒ.ආර්.ඊ. දමරුවන් ලබා දුන් ප්‍රකාශය සහ 2017.05.13 දිනැති යුද්ධ හමුදාධිපති නිගමනය අනුව, වින්දිත ලුතිනන් චන්ද්‍රරත්න වෙත සිදුවූ පහරදීම සහ ඊට සම්බන්ධ කරුණු එකිනෙක අනුකූල වේ. වින්දිත ලුතිනන් චන්ද්‍රරත්න වෙත කම්මුල් පහරවල් තුනක් ගැසූ බවට ලුතිනන් ආර්.ඒ.ආර්.ඊ. දමරුවන් නිලධාරියා කොමිසම හමුවේ පිළිගෙන ඇති අතර, එකී පහරදීම සහ ඊට පෙර බලහත්කාරයෙන් කේක් කැවීම ඇතුළු හිංසනයන් සිදුවූ බව යුද්ධ හමුදාධිපති නිගමනය මගින් ද තහවුරු කර ඇත. තවද, මෙම හිංසනය දරාගත නොහැකිව වින්දිත නිලධාරියා කඳවුරෙන් බැහැරව යාම සහ එමගින් ඔහු තුළ ඇති වූ තරමක් බරපතල අසනීප තත්ත්වය "සේවයට අදාළ වූවක්" ලෙස යුද්ධ හමුදාධිපතිවරයා නිගමනය කර තිබීම හරහා, වගඋත්තරකරු ඇතුළු පිරිසගේ පහරදීම හා හිංසනකාරී හැසිරීම වින්දිතයාගේ කායික හා මානසික බිඳවැටීමට හේතු වී ඇති බව සනාථ කිරීමක් බව පෙනී යයි.

04. කොළඹ ජාතික රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය මහේෂ් රාජසූරිය මහතාගේ සහ නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කර්නල් එස්.එම්.ඩබ්ලිව්.හේරත් මහතාගේ වෛද්‍ය වාර්තා අනුව, වින්දිත ලුතිනන් ආර්.ජී.චන්ද්‍රරත්න නිලධාරියා මුහුණ දුන් සිදුවීමෙන් අනතුරුව දැඩි මානසික බිඳවැටීමකට ලක්ව ඇති බවත්, සිදු වූ පහරදීම සහ පීඩනය හේතුවෙන් ඇති වූ විෂාදය, පාලනය කරගත නොහැකි භීතිය මෙන්ම සාමාන්‍ය ජීවිතයේ ක්‍රියාකාරකම් කර ගැනීමට නොහැකි වන පරිදි සිතේ හටගත් කැළඹිලි සහගත ස්වභාවය පදනම් කරගනිමින්, ඔහු Adjustment Disorder නමැති අක්‍රමිකතාවයෙන් පෙළෙන බව විශේෂඥ වෛද්‍යවරුන් සායනිකව සනාථ කර ඇත. කොළඹ ජාතික රෝහලේ මනෝ වෛද්‍ය ඒකකයෙන් (59 වාට්ටුව) මූලික ප්‍රතිකාර ලැබීමෙන් පසු වැඩිදුර දීර්ඝකාලීන ඖෂධීය හා උපදේශන ප්‍රතිකාර සඳහා යුද්ධ හමුදා රෝහල වෙත යොමු කර තිබීමෙන් පෙනී යන්නේ, එකී හිංසනකාරී සිදුවීම වින්දිතයා තුළ අඛණ්ඩ මානසික ආබාධයක් නිර්මාණය කිරීමට හේතු වී ඇති බවයි.

05. මෙම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව, පැමිණිලිකාර ලුතිනන් ආර්.ජී. චන්ද්‍රරත්න වෙත වගඋත්තර නිලධාරීන් විසින් එල්ල කර ඇති හිරිහැර හුදෙක් විනය ක්‍රියාමාර්ග ඉක්මවා ගිය, පුද්ගල ගෞරවයට හානි කරන ක්‍රියාවන් බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, කිලෝග්‍රෑම් 2 ½ ක කේක් ප්‍රමාණයක් බලහත්කාරයෙන් අනුභව කරවීම සහ අධික ලෙස ජලය පානය කරවමින් සිදු කළ හිරිහැර කිරීම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ සහතික කර ඇති "වධහිංසාවලින් නිදහස් වීමේ අයිතිය" උල්ලංඝනය කිරීමක් ලෙස නිරීක්ෂණය කළ හැකිය.

06. යුද්ධ හමුදාව විසින් පවත්වන ලද අභ්‍යන්තර මූලික පරීක්ෂණයේ (Court of Inquiry) නිගමන සහ විශේෂඥ වෛද්‍ය මණ්ඩල නිර්දේශ මගින් වින්දිත නිලධාරියා මුහුණ දුන් අසනීප තත්ත්වය "සේවයට අදාළ තරමක් බරපතල තත්ත්වයක්" ලෙස හමුදාපතිවරයා විසින් සඳහන් කර ඇති නමුත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) යටතේ ආවරණය නොවන අනතුරක් වන බැවින් අදාළ අනතුරු වන්දි මුදල් ගෙවීම ආරක්ෂක අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව යුද්ධ හමුදාව විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (සහ එහි සංශෝධන) හි ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීමේදී, වින්දිත නිලධාරියා වෙත වන්දි අනුමත නොකිරීමට ආරක්ෂක අමාත්‍යාංශය චක්‍රලේඛයේ 1 වන සහ 2 වන වගන්ති ප්‍රකාරව වන්දි හිමිකම් පැනනගින්නේ රාජකාරිමය කාර්යයක නිරතව සිටියදී සිදුවන "හදිසි අනතුරක්" හෝ සේවා යෝජකයාගේ අනුමත ක්‍රියාකාරකමක් අතරතුර සිදුවන ශාරීරික හානියක් පදනම් කරගෙන වන බැවිනි. හමුදා කඳවුර තුළ නිලධාරීන් අතර සිදුවූ අනුමත නොවන බලහත්කාරී හිංසනය සහ පහරදීම යනු රාජකාරිමය කාර්යයක ප්‍රතිඵලයක් නොව, දණ්ඩ නීති සංග්‍රහය සහ වධහිංසාවලට එරෙහි පනත යටතේ වරදක් වන ක්‍රියාවක් වන බැවින්, එය චක්‍රලේඛයේ සඳහන් "රාජකාරිමය අනතුරක්" යන අර්ථ නිරූපණයට ආවරණය නොවන බවට නිගමනය කිරීමේ පදනම නිවැරදි යැයි සැලකිය හැක. ඒ අනුව වින්දිත වෙත වගඋත්තර පාර්ශවය වෙතින් කිසිදු වන්දි මුදලක් සඳහා හිමිකමක් ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

07. <u>අමල් සුදත් සිල්වා එ.පො.ප කොඩිතුවක්කු නඩුව මෙන්ම ඩිල්ෂාන් තිලකරත්න සහ වයි.කුමාරිහාමි ඒ.සාජන් ඩග්ලස් ඇල්ලේපොල සමග වෙනත් අය **(SCFR 578/2011)**</u> නඩුවේදී පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ නිදහස සහ ආරක්ෂාව පිළිබඳව ව්‍යවස්ථාමය හිමිකම භුක්ති විඳිමට අයිතිය තිබිය යුතු අතර, සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවන් පවා වධහිංසාවට අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට ලක් නොවීමේ අයිතිය නීතිය අනුව පවතින බව දක්වා ඇත.

08. තවද, *සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව (1989) 2 SLR 393* යන නඩුවේදී අධිකරණය විසින් ලබා දී ඇති තීන්දුවට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති ආරක්ෂාව හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට පමණක් සීමා නොවේ. එම ව්‍යවස්ථාවේ විෂය පථය පුද්ගලයෙකුගේ ආත්මය, මානසිකත්වය සහ අභ්‍යන්තර පෞරුෂයට එල්ල වන බලපෑම් ද ආවරණය වන පරිදි පුළුල්ව අර්ථ දක්වා ඇත. ඒ අනුව, පුද්ගලයෙකු වෙත එල්ල වන වාචික හෝ මානසික පීඩාව ද 11 වන වගන්තිය යටතේ වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස සැලකිය හැකි බව තහවුරු වේ.

09. තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධීක්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් **<u>තුරෙයි රාජා විනිසුරුතුමා විසින් ආර්.ඒ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය තවත් කොට්ඨාශය හා තවත් අය (SCFR/505/19)</u>** නඩුවේ දී දක්වා ඇත.

නිගමනය

මෙම පැමිණිල්ලට අදාළව සිදුකරන ලද විමර්ශන වල දී ඉදිරිපත් කරන ලද කරුණු සහ ඉදිරිපත් වූ සාක්ෂි, වෛද්‍ය වාර්තා සහ යුධ හමුදා අභ්‍යන්තර පරීක්ෂණ වාර්තා සහ යුද්ධ හමුදාධිපති නිගමනය අනුව, මෙම සිදුවීමේ දී වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් තුළ වධහිංසාවක හෝ කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලක මූලිකාංගයන් සපිරී පවතින බව නිරීක්ෂණය වේ.වින්දිත නිවාඩු ගොස් පැමිණි අවස්ථාවේ දී රසකැවිලි ගෙන ඒමේ අනුමත නොවන නියෝගය අභිමතයට පටහැනිව ඉටු කිරීමට සැලැස්වීම සහ එම කේක් නොලැබුණි යැයි පවසමින්, වින්දිත ලුතිනන් ආර්.ජී. චන්ද්‍රරත්න වෙත බලහත්කාරයෙන් කේක් අනුභව කරවීම, අධික ලෙස ජලය පානය කරවීම සහ මුහුණට කම්මුල් පහරවල් එල්ල කරමින් පහරදීම මගින් ඔහුට මානසික හා ශාරීරික පීඩාවක් ඇති කර තිබීම ද, එම ක්‍රියාවන් කණිෂ්ඨ නිලධාරියා පීඩාවට පත් කිරීමේ සහ දඬුවම් කිරීමේ ඍජු චේතනාවෙන් සිදු කර තිබීම මෙන්ම, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස තමන් සතු නිල අධිකාරී බලය සහ නිල තත්ත්වය අයුතු ලෙස භාවිතා කරමින් මෙම පහරදීම හා වධහිංසනයන් සිදු කර තිබීම ද යන කරුණු අනාවරණය වේ.

ඒ අනුව, යම් ක්‍රියාවක් 'වධහිංසාවක්' ලෙස අර්ථ දැක්වීම සඳහා සපුරාලිය යුතු මූලිකාංග ත්‍රිත්වය වන තදබල ශාරීරික හා මානසික පීඩාවක් ඇති කිරීම, දඬුවම් කිරීමේ හෝ පීඩාවට පත් කිරීමේ පරමාර්ථය පැවතීම සහ රාජ්‍ය නිලධාරියෙකු හෝ අධිකාරී බලයක් සහිත පුද්ගලයෙකු විසින් එම ක්‍රියාව සිදු කරනු ලැබීම යන සියලුම සාධක මෙම සිදුවීම තුළ සම්පූර්ණ වී ඇති බව පෙනී යයි.

ඒ අනුව, මෙම සිදුවීමේදී වින්දිත ලුතිනන් ආර්. ජී. චන්ද්‍රරත්නගෙන් බලහත්කාරයෙන් කේක් ඉල්ලා සිටීමත්, එය ලබා නොදුන් පසු ඔහුව කාමරයකට කැඳවා ඔහුගේ කැමැත්තකින් තොරව බලහත්කාරයෙන් කේක් අනුභව කරවීමට කපිතාන් බී. ඒ.බෝම්බුවල සහ ලුතිනන් ඩයස් යන නිලධාරීන් කටයුතු කර ඇත. එමගින්, වගඋත්තරකාර ලුතිනන් ආර්.ඒ.ආර්.ටී.දම්රුවන් වෙත වින්දිතයාට පහරදීම සඳහා අවශ්‍ය පසුබිම සකසා දෙමින් ඊට ඍජුවම අනුබල දී ඇති බව තහවුරු වේ. එමගින්, 01, 02 සහ 03 යන වගඋත්තරකරුවන්ගේ මෙම සාමූහික ක්‍රියාකලාපය හරහා, වින්දිත ලුතිනන් ආර්. ජී. චන්ද්‍රරත්න වෙත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් සහතික

කර ඇති "වධහිංසාවලින් සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හෝ දඬුවම්වලින් නිදහස් වීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

නිර්දේශ

1. වින්දිත ලුතිනන් ආර්. ජී. චන්ද්‍රරත්නට වධහිංසා පමුණුවමින් සිදුකළ ශාරීරික හා මානසික හානිය මෙන්ම, ඒ හේතුවෙන් ඔහුගේ යුද්ධ හමුදා වෘත්තීය ජීවිතය අහිමි කිරීම මඟින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් තහවුරු කර ඇති 'වධහිංසාවලින් සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් නිදහස් වීමේ' මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීම වෙනුවෙන්, පළමු වගඋත්තර ලුතිනන් ආර්.ඒ.ආර්.ඊ. දම්රුවන් විසින් වින්දිත නිලධාරියා වෙත රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00) මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් ගෙවිය යුතුය.

2. තවද, කඳවුරු පරිශ්‍රය තුළදී අදාළ කනිෂ්ඨ නිලධාරියාට බලහත්කාරයෙන් කේක් අනුභව කිරීමට සැලැස්වීමේ සහ ඔහුට පහරදීමේ සිදුවීමට අනුබල දෙමින් කටයුතු කිරීම හරහා, වින්දිත ලුතිනන් ආර්. ජී. චන්ද්‍රරත්නගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් තහවුරු කර ඇති 'වධහිංසාවලින් සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් නිදහස් වීමේ' මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීම වෙනුවෙන්, දෙවන වගඋත්තර කපිතාන් බෝම්බුවල විසින් වින්දිතයා වෙත රුපියල් ලක්ෂයක (රු.100,000.00) මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් ගෙවිය යුතුය.

3. කඳවුරු පරිශ්‍රය තුළදී කනිෂ්ඨ නිලධාරියෙකුට බලහත්කාරයෙන් කේක් අනුභව කිරීමට සැලැස්වීම සහ ඔහුට පහරදීම සඳහා අනුබල දෙමින් කටයුතු කිරීම හරහා, වින්දිත ලුතිනන් ආර්. ජී. චන්ද්‍රරත්නගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් තහවුරු කර ඇති 'වධහිංසාවලින් සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් නිදහස් වීමේ' මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීම වෙනුවෙන්, තෙවන වගඋත්තර ලුතිනන් පී.ඩී.එස්. ඩයස් විසින් ද වින්දිතයා වෙත රුපියල් ලක්ෂයක (රු.100,000.00) මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් ගෙවිය යුතුය.

4. යුද්ධ හමුදාව තුළ කනිෂ්ඨ නිලධාරීන්ට එරෙහිව සිදුවන මෙවැනි හිංසනයන් සහ අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි අනාගතයේදී පුනරාවර්තනයවීම වළක්වා ගැනීම උදෙසා, යුද්ධ හමුදාපතිවරයා විසින් සියලුම රෙජිමේන්තු සහ හමුදා කඳවුරු ආවරණය වන පරිදි මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කිරීමට පියවර ගත යුතුය.

5. මෙම සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වගඋත්තර නිලධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන මෙන්ම 1994 අංක 22 දරන වධහිංසා පනත යටතේ සුදුසු පියවර පොලිස්පතිවරයා ගත යුතුය.

2026. 11 . 19 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :

1.	අමාත්‍යතුමා ආරක්ෂක අමාත්‍යාංශය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	-	කරුණු දැන ගැනීම සඳහා.
2.	යුද්ධ හමුදාධිපති ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.	-	නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
3.	පොලිස්පතිතුමා පොලිස් මූලස්ථානය කොළඹ 02	-	නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා